No.40/18, Park Road, Colombo 05, Sri Lanka.
Tel: +94 11 2584416,+94 11 2592515, Fax: +94 112508484
Email: info@adicsrilanka.org
Web site: http//www.adicsrilanka.org

**2024.08.07**

**මාධ්‍ය නිවේදනය**

**සුරාබදු කොමසාරිස්වරයාගේ කාර්යය විය යුත්තේ මද්‍යසාරවල මිල අඩු කරන ලෙස මද්‍යසාර නිෂ්පාදන සමාගම්වලින් ඉල්ලමින් ජනතාවගේ මද්‍යසාර භාවිතය වැඩි කිරීමට කටයුතු කිරීම නොව, මද්‍යසාර සමාගම්වලින් අයකර ගත යුතු බිලියන ගණනක හිඟ බදු මුදල් රජයට අයකර ගැනීමයි.**

සුරාබදු දෙපාර්තුමේන්තුවට විධිමත්, කාර්යක්ෂම සුරාබදු අය කර ගැනීමේ ක්‍රමවේදයක් නොමැති වීම සහ මද්‍යසාර සමාගම්වලට වාසි සහගත ලෙස බදු අය කර ගැනීම නිසා 2024.06.30 දින වන විට සුරාබදු දෙපාර්තුමේන්තුව අහිමි කරගෙන ඇති මුළු හිඟ සුරාබදු හා අයභාරය රුපියල් බිලියන 1.8කි.

මේ පිළිබඳ විමර්ශනය කරන ලද පාර්ලිමේන්තු ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව, සුරාබදු කොමසාරිස් ජනරාල් එම කාරක සභාව මග හැරීම සහ කාරක සභාවේ නිර්දේශයන් නොසළකා හැරීම පාර්ලිමේන්තුවටත් කමිටුවටත් කරන අගෞරවයක් බව එහි සභාපතිවරයා ප්‍රකාශ කර ඇත. තවද එම හිඟ සුරාබදු සම්පූර්ණයෙන් අය කර ගන්නා ලෙසට කරන ලද නිර්දේශය සුරාබදු දෙපාර්තමේන්තුව විසින් පැහැර හැරීම පිළිබඳ පාර්ලිමේන්තු ක්‍රම හා විධි පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ දැඩි අප්‍රසාදයට ද ලක් වී ඇත.

එවන් පසුබිම්ක පසුගිය දා මාධ්‍ය අණාවරණය කර තිබුණේ සුරාබදු කොමසාරිස්වරයා මද්‍යසාර මිල පහළ දමන ලෙස මද්‍යසාර සමාගම් වලින් ඉල්ලා ඇති බවයි.

සුරාබදු කොමසාරිස්වරයාගේ කාර්යය විය යුත්තේ රටේ දැනටමත් බිලියන ගණන් හිඟ සුරා බදු ගෙවීම පැහැර හරිමින් සිටින මද්‍යසාර නිෂ්පාදකයන්ගෙන් හිඟ සුරා බදු අය කර ගැනීමයි.

තවද නීත්‍යානුකූල නොවන ආකාරයට වෙළඳ පොළට එන මද්‍යසාර නීතියේ රුහැනට යටත් කිරීම සහ වෙළඳපොළ තුළ ඇති සුරාබදු නොගෙවා අළෙවියට ඇති මද්‍යසාර හඳුනා ගැනීමත් ඒවා වෙළඳ පොළට නිකුත් කළ කුඨ ව්‍යාපාරිකයන් නීතියේ රුහැනට ගෙන ඒමයි. තවද එවැනි තත්වයන් ඇති වීම වැළැක්වීම සුරාබදු කොමසාරිස්වරයාගේ සහ එම දෙපාර්තුමේන්තුවේ ප්‍රමුඛ කර්යයකි.

එසේ නොමැතිව මද්‍යසාර මිල අඩු කරන ලෙස මද්‍යසාර සමාගම්වලින් ඉල්ලීම් කර රටේ ජනතාවගේ මද්‍යසාර භාවිතය වැඩි කර නැවතත් සමාගම් වලට වාසි සහගත තත්වයක් ඇති කරමින් ජනතාව මද්‍යසාර උගුලේ සිර කිරීමට කටයුතු නොකළ යුතු බව අවධාරණය කළ යුතුව ඇත.

මද්‍යසාර රටක ආදායමක් නොව වියදමක් බව විද්‍යාත්මකව ඔප්පු වී ඇත. අපේ රටේ මද්‍යසාර වලින් බදු ලැබුන ද මද්‍යසාර වලින් ලැබෙන සුරාබදු ආදායමට වඩා විශාල වියදමක් මද්‍යසාර හේතුවෙන් සිදුවන සෞඛ්‍ය සහ ආර්ථික පිරිවැය සඳහා වියදම් දැරීමට සිදු වී ඇත. 2023 වසරේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සිදු කළ සමීක්ෂණයකට අනුව එම වසරේ අපේ රටේ මද්‍යසාර නිසා සිදු වූ සෞඛ්‍ය සහ ආර්ථික පාඩුව රුපියල් බිලියන 237කි. නමුත් මද්‍යසාර බදුවලින් ලද සුරා බදු ආදායම රුපියල් බිලියන 165.2 කි. ඒ අනුව මද්‍යසාර රටක ආදායමක් නොව වියදමක් බව තව දුරටත් තහවුරු වේ.

සුරාබදු කොමසාරිස්වරයාගේ වගකීම වන්නේ රටේ ජනතාව මද්‍යසාර භාවිතයෙන් රෝගීන් බවට පත් කරමින්, පවුල් ජීවිත විනාශ කරමින්, රටේ සිදුවන අනතුරු වැඩි කරමින්, දරුවන්ගේ සතුට, නිදහස උදුරා ගනිමින්, කාන්තාවන්ට සිදුවන හිංසනය ප්‍රවර්ධනය කිරීම නොව මද්‍යසාර බදු නිවැරදිව අය කර ගනිමින් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් වෙළඳ පොළට එන මද්‍යසාර වැළැක්වීමට කටයුතු කිරීම බව මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය තරයේ අවධාරණය කර සිටිමු.

**සම්පත් ද සේරම්,**
**විධායක අධ්‍යක්ෂ,**
**මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය.**